## ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව - 2014

---------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 13 (6) වගන්තිය ප්‍රකාර ඉදිරිපත් කළ යුතු 2014 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවට ඇතුළත් වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------------

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 2. මූල්‍ය ප්‍රකාශන

------------------

### 2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-----------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2014 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2016 සැප්තැම්බර් 09 දින වන විටත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

### 2.2 ගිණුම් පොත්පත් හා ලේඛන පැවැත්වීම

---------------------------------------------

සංස්ථාවේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන ගොස් තිබුණද සමාලෝචිත වර්ෂයට අදාළ ගිණුම් පොත්පත් හා ලේඛන සම්පූර්ණ කර නොතිබුණි.

### 2.3 වත්කම් හා වගකීම්වල පැවැත්ම

---------------------------------------

සංස්ථාව විසින් අවසන්වරට පිළියෙළ කරන ලද 2013 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වත්කම් | වටිනාකම |
|---|---|
| | රු. |
| ජංගම නොවන වත්කම් | 5,805,009,280 |
| ජංගම වත්කම් | 161,866,142 |
| මුළු වත්කම් | 5,966,875,422 |

බැරකම්

| | |
|---|---|
| ජංගම බැරකම් | 1,179,046,151 |
| ජංගම නොවන බැරකම් | 233,890,743 |
| මුළු බැරකම් | 1,412,936,894 |
| ශුද්ධ වත්කම් / අයිතිය | 4,553,938,528 |
| මුළු බැරකම් | 5,966,875,422 |
| | |
| මුළු ආදායම | 655,699,345 |
| මුළු වියදම | 873,483,759 |
| ඌනතාවය | 217,784,414 |

## 2.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම්

පහත සඳහන් විෂයයන් වලට අදාලව ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| ඉන්ධන වියදම් | 114,069 | බිල්පත් සහ ධාවන සටහන් |
| ලිපි ද්‍රව්‍ය වියදම් | 305,299 | බිල්පත් |
| කම්කරු කුලී | 705,010 | කම්කරුවන් සැපයීමට අදාල ගිවිසුම |

## 2.5 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්.

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXVIII පරිච්ඡේදයේ 1 වගන්තිය හා 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | පැමිණීම හා පිටවීම සනාථ කර ගැනීමකින් තොරව හා නිසි කාර්යභාරයක් ඉටුකර නොගෙන නිළධාරියෙකු වෙත සමාලෝචිත වර්ෂයේ ජූලි මාසයේ සිට අගෝස්තු දක්වා රු. 43,608 ක වැටුප් ගෙවා තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ V පරිච්ඡේදයේ 7.1 ඡේදය | වතු අධිකාරීවරයකු සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් 30 දින සිට නිවාඩු අනුමත කර ගැනීමකින් තොරව සේවයට වාර්තා කර නොතිබූ නමුත් ඒ සඳහා ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 137 | ගෙවීම් අනුමැතියකින් තොරව රු.14,298,894 ක් වටිනා චෙක්පත් ලියා තිබුණි. |
| (ඈ) 1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2006 ඔක්තෝබර් 09 දිනැති අංක පීඊඩී 39 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | නිල වාහන හිමිකම් නොමැති නිලධාරියෙකු වෙත සමාලෝචිත වර්ෂයේ මාස 05 ක් වෙනුවෙන් පුද්ගලික කටයුතු සඳහා වාහනයක් ලබා දී තිබුණි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාව මගින් පාලනය කරනු ලබන වතුයායන් 12කට අදාල 2013 හා සමාලෝචිත වර්ෂයේ හෙක්ටයාරයක නිම් තේ අස්වැන්න පහත දැක්වේ.

| වතුයාය | භූමි ප්‍රමාණය | හෙක්ටයාරයක නිම් තේ අස්වැන්න | | |
|---|---|---|---|---|
| | | 2014 | 2013 | වෙනස |
| | හෙක්ටයාර් | කි.ග්‍රෑ | කි.ග්‍රෑ | කි.ග්‍රෑ |
| ඕපල්ගල | 104 | 633 | 854 | (221) |
| ගල්පිල්ල | 235 | 629 | 821 | (192) |
| ගෝමර | 165 | 671 | 723 | (52) |
| රංගල | 215 | 549 | 700 | (151) |
| හාගල | 252 | 596 | 693 | (97) |
| කැලෑබොක්ක | 583 | 506 | 662 | (156) |
| හුන්නස්ගිරිය | 207 | 469 | 608 | (139) |
| අලකොල්ල | 338 | 499 | 572 | (73) |
| මිඩ්ලන්ඩ් | 259 | 448 | 529 | (81) |
| හෙයාපාර්ක් | 204 | 274 | 351 | (77) |
| කොටගහ | 185 | 228 | 301 | (73) |
| නිකොලොඔය | 92 | 381 | 451 | (70) |
| | 2839 | 5,883 | 7265 | (1382) |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) හෙක්ටයාරයක සාමාන්‍ය ප්‍රමිත නිමි තේ අස්වැන්න දළ වශයෙන් කිලෝග්‍රෑම් 1736.5 ක් වුවද සමාලෝචිත වර්ෂයේ දත්ත අනුව වතුයායන්හි එම අගය කිලෝග්‍රෑම් 228 සිට කිලෝග්‍රෑම් 671 දක්වා පරාසයක පැවතුණ අතර සියළුම වතුයායන්හි හෙක්ටයාරයක නිමි තේ අස්වැන්න 2013 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සියයට 19 කින් අඩු වී තිබුණි.

(ආ) 2013 වර්ෂය තුල සංස්ථාවේ නිමි තේ නිෂ්පාදනය දළ වශයෙන් කිලෝග්‍රෑම් 1,762,301 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ එය කිලෝග්‍රෑම් 1,402,229 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් 360,072 කින් එනම් සියයට 20 කින් පහළ ගොස් තිබුණි.

(ඇ) සංස්ථාවේ තේ වගාකර ඇති භූමි ප්‍රමාණය වන හෙක්ටයාර් 2,839 මගින් වාර්ෂිකව නිෂ්පාදනය කළ යුතු සම්මත නිමි තේ ප්‍රමාණය කිලෝග්‍රෑම් 4,926,451 ක් විය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ එයින් සියයට 28 ක් හෙවත් කිලෝග්‍රෑම් 1,402,229 ක් පමණක් නිෂ්පාදනය කර තිබුණි.

(ඈ) 2013 හා සමාලෝචිත වර්ෂයේ බාහිර වැවිලිකරුවන් වෙත ලබාදී තිබූ භූමි ප්‍රමාණය හා ලබාගෙන තිබූ නිමි තේ නිෂ්පාදිතය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | **2014** | | **2013** | |
|---|---|---|---|---|
| **වතුයායේ නම** | **භූමි ප්‍රමාණය** | **නිමි තේ නිෂ්පාදිතය** | **භූමි ප්‍රමාණය** | **නිමි තේ නිෂ්පාදිතය** |
| | (හෙක්ටයාර්) | (කි.ග්‍රෑ) | (හෙක්ටයාර්) | (කි.ග්‍රෑ) |
| අලගොල්ල | 56 | 6,765 | 56 | 8,584 |
| කොටගහ | 267 | 26,974 | 267 | 34,161 |
| ගෝමර | 76 | 12,633 | 69 | 8,040 |
| හාගල | 134 | 17,662 | 134 | 13,691 |
| හෙයාර්පාර්ක් | 144 | 32,529 | 144 | 38,935 |
| හුන්නස්ගිරිය | 17 | 1,960 | 17 | 3,855 |
| කැලැබොක්ක | 128 | 15,282 | 112 | 16,594 |
| මිඩ්ලන්ඩ් | 27 | 3,030 | 27 | 2,650 |
| නිකොලාඔය | 40 | 2,090 | 40 | 439 |
| ඕපල්ගල | 52 | 1,717 | 52 | 1,350 |
| රංගල | 110 | 31,957 | 110 | 37,339 |
| **එකතුව** | **1,051** | **152,599** | **1,028** | **165,638** |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) බාහිර වැවිලිකරුවන් විසින් 2013 වර්ෂයේදී ලබා දී තිබූ අමු තේ දළු වලට අදාල නිමි තේ නිෂ්පාදනය වූ කිලෝග්‍රෑම් 165,638 ක් හා සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් 152,599 ක් වූයෙන් කිලෝග්‍රෑම් 13,039 කින් එනම් සියයට 8 කින් නිමවුම පහළ ගොස් තිබුණි.

(ii) බාහිර වැවිලිකරුවන් විසින් නඩත්තු කරනු ලබන සංස්ථාව සතු, ක්ෂේත්‍රයන්හි භූමි ප්‍රමාණය වන හෙක්ටයාර් 1051 මගින් වාර්ෂිකව නිෂ්පාදනය කළ යුතු සම්මත නිමි තේ නිමැවුම කිලෝග්‍රෑම් 1,826,798 ක් විය යුතු වුවත් බාහිර පාර්ශවයන් විසින් නිෂ්පාදනය කර තිබුණේ ඉන් සියයට 8 ක් පමණි.

(ඈ) වතුයායන්හි නිමවුම් ඉලක්ක සහ කාර්යසාධනය පහත දැක්වේ.

| වතුයායේ නම | ඇස්තමේන්තුගත නිෂ්පාදනය | සත්‍ය නිෂ්පාදනය | ලඟාකර ගන්නා ලද ඉලක්කය | ඇස්තමේන්තුගත නිෂ්පාදනය | සත්‍ය නිෂ්පාදනය |
|---|---|---|---|---|---|
| | 2014 | | | 2013 | |
| | කි.ග්‍රෑ | කි.ග්‍රෑ | % | කි.ග්‍රෑ | කි.ග්‍රෑ |
| අලගොල්ල | 320,000 | 168,836 | 53 | 250,000 | 193,647 |
| කොටගහ | 60,000 | 42,009 | 70 | 60,000 | 55,542 |
| ගල්පිහිල්ල | 240,000 | 148,581 | 62 | 243,000 | 193,569 |
| ගෝමර | 150,000 | 110,132 | 73 | 153,000 | 123,390 |
| හාගල | 250,000 | 150,111 | 60 | 230,000 | 175,972 |
| හෙයාර්පාර්ක් | 75,000 | 55,821 | 74 | 75,000 | 71,532 |
| හුන්නස්ගිරිය | 175,000 | 97,148 | 56 | 190,000 | 112,754 |
| කැලැබොක්ක | 539,640 | 294,625 | 55 | 540,000 | 396,854 |
| මිඩ්ලන්ඩ් | 201,000 | 116,075 | 58 | 222,470 | 191,841 |
| නිකොලාඔය | 64,000 | 35,110 | 55 | 12,000 | 7,916 |
| ඕපල්ගල | 100,000 | 65,790 | 66 | 100,000 | 88,821 |
| රංගල | 200,000 | 117,991 | 59 | 210,000 | 150,463 |
| **එකතුව** | **2,374,640** | **1,402,229** | **59** | **2,285,470** | **1,762,301** |

පහත සඳහන් නිරීක්ෂණ ඉදිරිපත් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය සඳහා එක් එක් වතුයායන් වෙත ලබා දී තිබූ ඉලක්ක අතුරින් වතුයායන් තුනක් හැර ඉතිරි සියළුම වතුයායන් වල කාර්යසාධනය සියයට 53 සිට සියයට 66 ක මට්ටමේ පැවතුණි.

(ii) 2013 වර්ෂය තුලදී සංස්ථාව විසින් ඒ ඒ වතුයායන් වෙත ලබා දී තිබූ ඉලක්ක ගත නිම් තේ නිෂ්පාදිතය ලඟාකර ගැනීමට එකදු වතුයායකටවත් නොහැකිව තිබියදී, ඒ පිළිබඳව නිසි අධ්‍යයනයකින් තොරව පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී ඉහළ ඉලක්කයක් ලබාදී තිබුණි.

(ඉ) 2013 හා සමාලෝචිත වර්ෂයේ තේ කිලෝවක නිෂ්පාදන පිරිවැය (**COP**) හා සාමාන්‍ය විකුණුම් වටිනාකම (**NSA**) පහත පරිදි වේ.

| වතුයායේ නම | 2014<br>නිෂ්පාදන පිරිවැය | සාමාන්‍ය විකුණුම් වටිනාකම | දායකය | 2013<br>නිෂ්පාදන පිරිවැය | සාමාන්‍ය විකුණුම් වටිනාකම | දායකය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| අලකොල්ල | 345 | 270 | (75) | 332 | 241 | (91) |
| කොටගඟ | 659 | 287 | (372) | 527 | 248 | (279) |
| ගල්පිහිල්ල | 317 | 269 | (48) | 359 | 268 | (91) |
| ගෝමර | 355 | 265 | (90) | 416 | 296 | (120) |
| හාගල | 353 | 284 | (69) | 348 | 277 | (71) |
| හෙයාර්පාර්ක් | 410 | 264 | (146) | 365 | 227 | (138) |
| හුන්නස්ගිරිය | 408 | 267 | (141) | 423 | 267 | (156) |
| කැලෑබොක්ක | 536 | 311 | (225) | 445 | 280 | (165) |
| මිඩ්ලන්ඩ් | 507 | 328 | (179) | 418 | 300 | (118) |
| නිකොලාඔය | 442 | 327 | (115) | 533 | 393 | (140) |
| ඕපල්ගල | 349 | 332 | (17) | 322 | 305 | (17) |
| රංගල | 461 | 277 | (184) | 442 | 285 | (157) |

ඉහත වගුව අනුව සංස්ථාවේ සෑම වතුයායකම තේ කිලෝවක සාමාන්‍ය විකුණුම් මිල ඉක්මවූ නිෂ්පාදන පිරිවැයක් පැවතුණි.

(ඊ) වතුයායන් පිහිටි මාතලේ හා මහනුවර දිස්ත්‍රික්ක අයත් කලාපයේ පෞද්ගලික කර්මාන්තශාලා 05 ක වෙන්දේසියේදී තීරණය වී තිබූ තේ කිලෝවක සාමාන්‍ය මිල මට්ටම රු. 555 ක් වන අතර සංස්ථාවේ කර්මාන්තශාලාවල සමාලෝචිත වර්ෂයේ සාමාන්‍ය මිල මට්ටම රු. 323 ක් වී තිබුණි. මෙසේ මිල මට්ටම් අඩුවීම කෙරෙහි නෙලනු ලබන දළුවල ගුණාත්මකභාවයේ පවතින අඩුපාඩු, කර්මාන්තශාලාවල පවතින යන්ත්‍රසූත්‍ර වල තත්ත්වය සහ කළමනාකරණ දුර්වලතා ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වලහන්දුව වතුයාය තේ ශක්ති අරමුදල මගින් සංස්ථාව වෙත භාරදෙන අවස්ථාවේදී පැවති රු.1,970,172 ක ගෙවිය යුතු පාරිතෝෂික මුදල සංස්ථාව විසින් ගෙවා අවසන් කර ඇතත් තේ ශක්ති අරමුදලෙන් අයකර ගැනීම සඳහා කළමනාකරණය විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) සංස්ථාව විසින් වලහන්දුව වතුයායේ තේ දළු සමාලෝචිත වර්ෂයේදී මාදොල තේ කර්මාන්තශාලාව වෙත ලබාදී තිබුණ ද දෙපාර්ශවය අතර ගිවිසුමකට එළඹ නොතිබුණි.

## 3.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

සංස්ථාව විසින් 2011 වර්ෂයේ සිට 2013 දක්වා ඕපල්ගල සහ මිඩ්ලන්ඩ් වතුයායන් තුල හෙක්ටයාර් 98.5ක ආරම්භ කරන ලද සුළු අපනයන භෝග වගාවන් සඳහා පිළිවෙලින් රු. 15,468,811 ක් හා රු.2,351,908 ක් වියදම් කර තිබුණද සමාලෝචිත වර්ෂයේදී එම ව්‍යාපෘති අතහැර දමා තිබුණි.

## 3.4 කාර්ය මණ්ඩල පරිපාලනය

සංස්ථාවේ කාර්ය මණ්ඩලය හා කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ පරිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

යන්ත්‍රසූත්‍ර නිසිපරිදි නඩත්තු නොකිරීම හේතුවෙන් ගෝමර කර්මාන්තශාලාව 2014 ජනවාරි සිට අක්‍රීයව පැවතුණු අතර රංගල තේ කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන කටයුතු සමාලෝචිත වර්ෂයේදී අඛණ්ඩව සිදු කිරීමට නොහැකිවී තිබුණි.

## 3.6 ආර්ථික නොවන ගනුදෙනු

මිඩ්ලන්ඩ් වතුයාය තුල සේවයේ නියුතු නිලධාරින් 9 දෙනෙකු සමාලෝචිත වර්ෂයේ මැයි සිට නොවැම්බර් දක්වා සේවයට වාර්තා කර නොතිබූ අතර උක්ත කාල සීමාව සඳහා රු.1,377,462 ක වැටුප් එම නිළධාරීන්ට ගෙවා තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 4.1 අභ්‍යන්තර විගණනය

වාර්ෂික විගණන සැලැස්ම අනුව වතුයායන් 14 ක්, ප්‍රාදේශීය කාර්යාලය හා ප්‍රධාන කාර්යාලයේ සියලුම අංශ ආවරණය කිරීමට සැලසුම්කර තිබුණද, ඉන් වතුයායන් 4 ක් හා ප්‍රධාන කාර්යාලයේ වවුචර් පරීක්ෂාව පමණක් සිදුකර තිබුණි. මේ අනුව අභ්‍යන්තර විගණන අංශය විසින් තම සැලසුම්ගත ඉලක්ක ලඟා කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදි නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමුකරන ලදී. පහත සඳහන් ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|
| (අ) ලේඛන පවත්වා ගැනීම | මූලාශ්‍ර ලේඛන නිසිපරිදි නඩත්තු කර නොතිබීම. |
| (ආ) අයවැය පාලනය | අයවැයගත ඉලක්ක සපුරාගැනීම අධීක්ෂණය කිරීම පහළ මට්ටමක පවතින අතර, කාර්යසාධනය වර්ධනය කරගැනීමට අදාල තාක්ෂණික මෙවලම් සහ ක්‍රියාවලීන් භාවිතා නොකිරීම. |

| | | |
|---|---|---|
| (ඇ) | සේවක කළමනාකරණය | සේවකයින් අතර නිසිපරිදි වැඩ බෙදීම් සිදුනොකිරීම, පැමිණීමේ සටහන් පවත්වා නොගැනීම හා ක්ෂේත්‍ර තුණ්ඩු භාවිතය අඛණ්ඩව සිදු නොවීම. |
| (ඈ) | අභ්‍යන්තර විගණනය | අභ්‍යන්තර විගණන සැලැස්ම අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක නොකිරීම. |
| (ඉ) | ගිණුම්කරණය | ඉංගිරිය වතුයාය වෙනුවෙන් ලෙජර් ගිණුම් නඩත්තු නොකිරීම. |
| (ඊ) | ගිවිසුම් පාලනය | තේ දළු අලෙවිය සම්බන්ධයෙන් ගිවිසුම්වලට එළඹ නොතිබීම. |